**ශ්‍රී ලංකා පදනම - 2023**

**--------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පදනමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 55 වන ඡේදය ප්‍රකාරව, 2018 වර්ෂයේදී මෝටර් රථයක් ප්‍රත්‍යාගණනය කිරීමෙන් රු.1,100,000 ක ප්‍රත්‍යගණන අතිරික්තයක් හඳුනාගෙන තිබුණි. අදාළ මෝටර් රථය 2022 වර්ෂයේ අපහරණය කරන අවස්ථාවේදී ඊට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තය සමුච්චිත අරමුදලට මාරුකර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල රු.1,100,000 කින් අඩුවෙන් දක්වන අතර ප්‍රත්‍යගණන අතිරික්තය රු.1,100,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 අප්‍රේල් 30 දිනට නිවැරදි කර ගිණුම් වලට ගලපා ඇත. | ප්‍රමිතයට අනුකූලව මෝටර් රථය අපහරණය කරන අවස්ථාවේදී ප්‍රත්‍යගණන අතිරික්තය සමුච්චිත අරමුදලට මාරු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 21 වන ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ තුළ ඇතුලත් රු.1,404,519 ක ගොඩනැගිලි අළුත්වැඩියාවන් දෙකක් ගොඩනැගිලි ඉදිකිරිමක් ලෙස හඳුනාගෙන තිබු හෙයින් ගොඩනැගිලි වත්කම රු.1,404,519 ක අගයකින් වැඩියෙන් දක්වා ගොඩනැගිලි අළුත්වැඩියා වියදම රු.1,404,519 කින් අඩුවෙන් දක්වා තිබිමත් ඊට අනුරූපිව ක්ෂය වියදම රු.44,713 කින් වැඩිපුර හඳුනාගෙන තිබිමත් නිසා වර්ෂයේ අතිරික්තය රු.1,359,806 ක අගයකින් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 මැයි මාසයේදී නිවැරදි කර ගිණුම් වලට ගලපන ලදී. | ප්‍රමිතයට අනුකූලව වත්කම් සඳහා දරන අළුත්වැඩියා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම් | රු.189,587 | 2015 – 2023 | කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි අළුත්වැඩියාව | රු.26,846,285 | නොනිමි කාර්යයන් පිළිබඳව ඇස්තමේන්තුවක් ලබා ගැනීම සඳහා පත්කල කමිටුවේ වාර්තාව | නොනිමි වැඩ පිළිබඳව සහ ඉදිරි කටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳව පරීක්ෂා කිරීමට පත්කළ කමිටුවේ නිර්දේශ පරිදි අවශ්‍ය පියවර ගනිමින් පවතී. කමිටු වාර්තාව වහාම ඉදිරිපත් කෙරේ. | අදාළ වාර්තා විගණනය සඳහා නොපමාව ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2010 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ශ්‍රී ලංකා පදනම විසින් පවත්වා ඇති අධ්‍යාපනික වැඩසටහන් සහ වැඩමුළු සඳහා විවිධ ආයතන වලින් ලැබිය යුතු රු.15,144,408 ක් සහ 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් බාහිර පාර්ශවයන්ට සපයන ලද සේවා වෙනුවෙන් අයවිය යුතු රු.2,093,692 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | අධ්‍යයන අංශයේ 2023 වසරට පෙර ශේෂයන්ගෙන් මේ වන විට රු.388,786.96ක් සහ ව්‍යාපාර සංවර්ධන අංශයේ රු. 6,300ක මුදලක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල ද අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | හිඟ ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා පදනමේ අංක 123 දරන Peo TV නාලිකාව, චිත්‍රාගාරය, පාලන පරිශ්‍රය, නිෂ්පාදන උපකරණ සහ අදාළ සේවාවන් කුලී පදනම මත | ණය මුදල් නිරවුල් කරන ලෙස දන්වමින් අදාළ ආයතන වෙත ලිපි මගින් අවස්ථා කිහිපයකදි දැනුම් දී ඇත. ඔවුන් මුදල් ගෙවීම පැහැර හැරි | හිඟ ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| ලබා දීමට අදාළ ගිවිසුම අනුව 2022 සහ 2023 වර්ෂයන් සඳහා පිළිවෙලින් රු.1,269,792 ක් සහ රු.8,724,248 බැගින් එකතුව රු.9,994,040 ක් අයකර ගත යුතුව තිබුණි. තවද ගොඩනැගිලි පරිශ්‍රයේ සහ නාලිකාවේ මාසික බදු කුලිය තීරණය කිරීමේ දී රජයේ තක්සේරු වටිනාකම ද, වෙළඳපොළ තුළ වර්තමානයේ පවතින මිළ ගණන් ද ඇගයීම් කර නොතිබුණ අතර චිත්‍රාගාරය හා එහි පවතින නිෂ්පාදන උපකරණ වල ආරක්ෂාව හා පැවැත්ම වෙනුවෙන් ආරක්ෂිත තැන්පතුවක් (Security Bond) ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අවස්ථාවක අධිකරණ ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ වීමට තීරණය කර ඇත. තවද මේ පිළිබඳව මු.රෙ.104 යටතේ පරීක්ෂණයක් ද ආරම්භ කර ඇත. | යුතුය. |
| (ඇ) 2017 වර්ෂයේදී බාහිර පාර්ශවයන් දෙකක් වෙත වෙනත් සේවා සැපයීම වෙනුවෙන් අයවිය යුතු රු.397,005 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකරවා ගැනීමට අපොහොසත්ව තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුව සමග සාකච්ඡා කොට නිර්දේශ ලබා ගෙන ඉදිරි කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ. | හිඟ ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවිය යුතු ගිණුම් යටතේ දක්වා ඇති ලද අත්තිකාරම් රු.4,863,414 ක ශේෂය තුළ හඳුනානොගත් ඍජු තැන්පතු ලෙස 2021, 2022 සහ 2023 වර්ෂයන් සඳහා පිළිවෙලින් රු.471,970, රු.568,750 ක් සහ රු.1,234,743 ක් පැවතුණි. ආයතනයේ බැංකු ගිණුම වෙත බාහිර පාර්ශවයන් විසින් ඍජුව තැන්පත් කර තිබුණු ඉහත ශේෂයන් හඳුනාගෙන ඒවා නිරවුල් කර නොතිබුණි. | 2021, 2022 හා 2023 වර්ෂවල බැංකුවේ තැන්පත් කර ඇති හඳුනා නොගත් ඉතිරි ශේෂ ගැලපීම් කිරීමට හා 2024 වර්ෂය ආරම්භයේ සිට හඳුනා නොගත් බැර කිරීම් ගැලපීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ද යොදා ඇත. | අදාළ ශේෂයන් හඳුනාගෙන කඩිනමින් නිරවුල් කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|

(අ) ආයතන විධිවිධාන වලට පටහැනිව, ශ්‍රී ලංකා මූලික විමර්ශනයේ ආයතන

| | | | |
|---|---|---|---|
| සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 2.1 ඡේදය | නාවික හමුදාවේ ලුතිනන් කමාන්ඩර් නිලයෙහි රාජකාරි ඉටු කරමින් සිටි නිලධාරියෙකු රාජ්‍ය සංස්ථාවක රාජකාරි සිදුකිරීම සඳහා තාවකාලිකව හෝ ස්ථිරව රාජ්‍ය සේවයෙන් මුදාහැර නොතිබියදී, 2021 අගෝස්තු 02 දින ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරෙහි රාජකාරි බාරගෙන තිබුණි. | නිර්දේශ මැයි 16 වැනි දා පැවැත්වෙන කළමනාකරණ මණ්ඩල රැස්වීමට යොමු කර ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කෙරේ. | සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ආයතන සංග්‍රහයේ vii වැනි පරිච්ඡේදයේ 12.2.5වගන්තිය | විධිවිධාන වලට පටහැනිව, ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂක (අධ්‍යයන) තනතුරේ රාජකාරි ආවරණය වෙනුවෙන් 2021, 2022, 2023 වර්ෂයන් තුළ දී රු.599,979 ක මුදලක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි. | ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගෙවන ලද පාරිශ්‍රමිකය ආපසු අයකර ගැනීමට කටයුතු කරන ලෙස දන්වන ලදි. ඒ පිළිබඳව ඉදිරි කළමනාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර සුදුසු පියවර ගනු ලැබේ. | පාරිශ්‍රමිකය ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 පරිච්ඡේදය | විධිවිධාන ප්‍රකාරව, 2023 දෙසැම්බර් 31 දින වන විටද, 2023 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණද ඒ සඳහා නිළධාරීන් 14 දෙනෙකුට රු.82,135 ක වියදමක් දරා බාහිර නිවාඩු නිකේතනයක වැඩමුළුවක් පවත්වා තිබුණි. | 2024-2028 දක්වා කාලයට අදාළව සකස් කරන ලද සංයුක්ත සැලැස්ම 2024 පෙබරවාරි 14 දින ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | විධිවිධාන ප්‍රකාරව නියමිත කාලය තුළ සංයුක්ත සැලැස්ම සකස්කර අනුමත කරගත යුතුය. |
| (ඈ) අංක 2001.03.137 දරන කළමණාකරන මණ්ඩල තීරණය | විධිවිධාන ප්‍රකාරව, සෑම කථිකාචාර්යවරයෙකුම 2023 වර්ෂයේදී මාසික ප්‍රගති වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | මාසික ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලයට දන්වා ඇත. | සෑම කථිකාචාර්යවර යෙකුම මාසික ප්‍රගති වාර්තා පවත්වාගත යුතුය. |
| (ඉ) 1995. සැප්තැම්බර් 07 දිනැති අංක 887/8 දරන ගැසට් පත්‍රය | තෘතීයික හා වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වනු ලබන ආයතන, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) තම ආයතන විසින් පවත්වනු ලබන පාඨමාලා ලියාපදිංචි කර, වාර්ෂිකව | පාඨමාලා 26ක් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ ලියාපදිංචි කර ඇත. තවත් පාඨමාලා 15ක් | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් පාඨමාලා ලියාපදිංචි කර, |

| | | | |
|---|---|---|---|
| | ලියාපදිංචිය අළුත් කළ යුතුය. පදනම් ආයතනය විසින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 43 ක් ලියාපදිංචි කර නොතිබුණි. | සඳහා ලියාපදිංචිය අයදුම්කර ඇත. ඊට අමතරව NVQ තත්ත්වය ලබාගැනීමේ ක්‍රමවේදය මේ වනවිට ආරම්භ කර ඇත. | වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කළ යුතුය |
| (ඊ) ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 14.3.3 වගන්තිය | සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු පිළිබඳ ඉල්ලීම ආයතන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවද, ආයතනයේ සේවයේ නියුතු කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සඳහා වර්ෂ 2ක් සහ මාස 6ක කාලයක් සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාදී රු.8,030,919 ක් ගෙවා තිබුණි. | සියළු ගෙවීම් කිරීම සහ නිවාඩු ලබා දීම් සිදුකර ඇත්තේ මීට පෙර කළමනාකාරීත්වය එකඟ වී තිබූ කොන්දේසි අනුවය. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සඳහා ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (උ) ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 14.6 වගන්තිය | ආයතනයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සඳහා වර්ෂ 2ක් සහ මාස 6ක කාලයක් සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සඳහා සේවය කල යුතු අනිවාර්ය සේවා කාලය වෙනුවෙන් ගිවිසුමකට එළැඹ නොතිබුණි. | ඉදිරියේදී ආයතන සංග්‍රහය හා අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව විධිමත් ලෙස ගිවිසුම්වලට එළඹීමට කටයුතු යොදා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ඌ) 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ පස්වන පරිච්ඡේදයේ ඇමුනුම් 01 | ආයතනය විසින් ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දී තිබුණද (KPI) ඒවා ඇගයීම් කර ඉන් ඉටුකරගත් ප්‍රමාණය කොපමණද යන්න (outcome) පරීක්ෂාකර නොතිබුණි. | 2024 සිට 2028 දක්වා සංයුක්ත සැලැස්මේ මෙම නිර්ණායක ඇතුළත් කර ඇති අතර ඉදිරියේ දී මෙම අඩුපාඩුව නිවැරදි කරලීමට පියවර ගනිමින් පවතී. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද මාර්ගෝපදේශ යට අනුකූලව හඳුන්වා දී ඇති කාර්යසාධන දර්ශක ඇගයීම් කර ඉටුකරගත් ප්‍රමාණය දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1(ඇ) වගන්තිය හා 2.6.1(අ)(ii) වගන්තිය | විධිවිධාන ප්‍රකාරව, පදනම විසින් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබූ රු.2,631.835 ක් වටිනාකම වූ ප්‍රසම්පාදනයන් 04 ක් සඳහා ලංසු කැඳවීමෙන් පසුව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර තිබුණි. | අඩුපාඩු, අතපසුවීම් වළක්වාගනිමින් සම්පත් සකසුරුවම්ව කාර්යක්ෂම සහ ඵලදායි ලෙස භාවිත කරමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට අවශ්‍ය පදනම සකසා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කළ යුතුය. |

**1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022/2023 තක්සේරු වර්ෂයට අදාළ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වාර්තාව, තක්සේරු වර්ෂය අවසන්ව එළඹෙන අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින වන විටද අදාල වාර්තාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත භාරදී නොතිබුණි. | නියමිත දිනට ගෙවිය යුතු මුදල් ගෙවා ඇති අතර 2023 වර්ෂයට අදාළ වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගෙන මාර්ගගත ක්‍රමය ඔස්සේ දැනටමත් ඉදිරිපත් කර ඇත. | නියමිත දිනට බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,806,726 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.53,397,480ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,590,754 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන ගිණුම් තැබීමේදී වාර්ෂිකව විලම්භිත ආදායමෙන් ක්‍රමක්ෂය ලෙස හඳුනාගන්නා ආදායම වෙනත් ආදායම් ලෙස හඳුනා නොගැනීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ (අධ්‍යයන) තනතුරෙහි සේවය කළ නිලධාරියා 2020 අගෝස්තු 28 දින සිට ස්ථිර විශ්‍රාම ගැන්වීම හේතුවෙන්, ශ්‍රී ලංකා පදනම එදිරිව එම නිලධාරියා විසින් පවරා තිබූ නඩුවේ 2023 ජූලි 07 දිනැති නඩු තීන්දුව පරිදි ඔහුට හිමි සියළු හිඟ වැටුප් ගෙවීමට සහ අධ්‍යක්ෂ (අධ්‍යයන) | පිළිතුරු ලබා දී නොමැත. | කළමනාකරණය විසින් ආයතනයට අවාසිදායක නොවන පරිදි නිවැරදි තීරණ ගැනීමට වග බලාගත යුතුය. |

තනතුරෙහි නැවත සේවයේ පිහිටුවීමට සිදුවී තිබුණි. ආයතනය වෙනුවෙන් සේවය නොකල 2019 අප්‍රේල් සිට 2023 නොවැම්බර් මාසය දක්වා හිඟ වැටුප්, සේවක අර්ථසාධන අරමුදල සඳහා දායක මුදල්, සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් සහ නීතිඥ ගාස්තු ලෙස පිළිවෙලින් රු.4,041,301 ක්, රු.1,132,573 ක්, රු.135,908 ක් සහ රු.390,466 ක් බැගින් එකතුව රු.5,700,250 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පරිදි, ශ්‍රී ලංකා පදනම විසින් පාඨමාලා සහ වැඩමුළු 82 ක් පැවැත්වීමෙන් රු.124,328,000 ක ආදායමක් ලබාගැනීමට සැලසුම් කර තිබුණද, 2023 වර්ෂය තුළදී එම පාඨමාලා සහ වැඩමුළු අතුරින් 65 ක් (සියයට 79) පැවැත්වීමට අපොහොසත් වීම නිසා රු.95,618,000 ක් වූ අපේක්ෂිත ආදායමක් (සියයට 77) අහිමි වී තිබුණි. | විධිමත් හා විද්‍යාත්මක ක්‍රමවේදයකින් තොරව මෙම සැලසුම් සකස් කිරීම නිසා මෙවැනි තත්ත්වයක් උද්ගත වී ඇති බැවින් ඉදිරියේ දී මේ තත්ත්වය වළක්වා ගැනීමට පියවර ගනිමින් පවතී. | ප්‍රායෝගික තත්ත්වයන් සලකාබලා සැලසුම් සකස්කළ යුතු අතර සැලැස්මේ කාර්යභාරයන් ඉටුකළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා පදනම විසින් පාඨමාලා පැවැත්වීම සඳහා අනුමත කථිකාචාර්ය තනතුරු 13 ක් පවතින අතර තත්‍ය කථිකාචාර්යවරු සංඛ්‍යාව 09 ක් විය. එම කථිකාචාර්යවරු සඳහා 2023 වර්ෂයේදී වැටුප් සහ දීමනා ලෙස රු.13,108,487 ක් ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාවකදී 2023 වර්ෂයේ ආරම්භ කල පාඨමාලා 21 කින් පාඨමාලා 04 ක් සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය පමණක් ලබාගෙන තිබූ අතර පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදුකර තිබුණි. තවත් පාඨමාලා 12 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය සියයට 75 ඉක්මවා ගොස් තිබුණි. | පාඨමාලාවල විෂයයන් වර්තමාන කථිකාචාර්යවරුන්ගේ විෂය පථයට අයත් නොවන අවස්ථාවල බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය වැඩි වැඩියෙන් ලබා ගැනීමට සිදුවේ. මෙයින් ධූර 04ක් පිරවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වනවිට ලැබී ඇති අතර ඉතිරි පුරප්පාඩු පිරවීම සඳහා ද අනුමැතිය ඉල්ලා ලිපි යොමු කර ඇත. | දැනට ස්ථිර තනතුරුවල නිරත වන කථිකාචාර්යවරුන්ගෙන් උපරිම සේවයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) 2023 දෙසැම්බර් 31 දින වනවිට, 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ආරම්භ කර පවත්වාගෙන ගොස් තිබූ පාඨමාලා සහ වැඩමුළු 85 අතරින් පාඨමාලා 30 ක් සඳහා 2023 දෙසැම්බර් 31 දිනට දින 62ත් – 742 ත් අතර කාල පමාවක් පැවති අතර පාඨමාලාව අවසන් කිරීම සඳහා දින 90 ට වඩා කාල ප්‍රමාද වී ඇති පාඨමාලා 28 ක්ද ඒ අතරින් දින 365 ට වඩා කාල ප්‍රමාද වී ඇති පාඨමාලා 08 ක්ද තිබුණි. | 2019-2021 වර්ෂය දක්වා පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පාඨමාලා සැලසුම් කළ පරිදි පැවැත්වීමට බාධා සිදුවූ අතර මෙම තත්ත්වය 2023 වසර අවසානයේදි කිසියම් සතුටුදායක මට්ටමකට ගැනීමට හැකියාව ලැබී ඇත. | නියමිත කාලසීමාව තුළ පාඨමාලා නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2023 වර්ෂය සඳහා ආරම්භ කර තිබූ පාඨමාලා සහ වැඩමුළු 26 අතුරින් පාඨමාලා සහ වැඩමුළු 11 ක් (42%) ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කර නොතිබූ පාඨමාලා සහ වැඩමුළු වූ අතර කථිකාචාර්යවරුන් දෙදෙනෙකු විසින් ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදුකල යුතු පාඨමාලා සහ වැඩමුළු අතුරින් එක් පාඨමාලාවක් (0%) හෝ ආරම්භ කර නොතිබුණු අතර සෙසු කථිකාචාර්යවරුන් විසින් ක්‍රියාකාරී සැලැස්මට අනුව පවත්වනු ලැබූ පාඨමාලා සහ වැඩමුළු සියයට 5 සිට සියයට 50 ක ප්‍රතිශතයක් අතර පැවතුණි. | විධිමත් හා විද්‍යාත්මක ක්‍රමවේදයකින් තොරව මෙම සැලසුම් සකස් කිරීම නිසා මෙවැනි තත්ත්වයක් උද්ගත වී ඇති බව නිරීක්ෂණය කර ඇත. එහෙයින් ඉදිරියේ දී මේ තත්ත්වය වළක්වා ගැනීමට පියවර ගනිමින් පවතී. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පාඨමාලා පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර ලේකම්ගේ 2021 සැප්තැම්බර් 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2021 හි 2.3 වගන්තිය ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධානයක් වෙත සෘජු කොන්ත්‍රාත් පැවරීමකදි අදාළ සමිතියේ යෝග්‍යතාව ඇගයීමට භාවිතාකළ හැකි නිර්ණායක ගැන සැලකිලිමත් නොවී, ව්‍යාජ බැංකු ගිණුම් විස්තර ඉදිරිපත් කල කොන්ත්‍රාත්කරුට රු.2,653,342 ක් වටිනා සේවක නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | අඩුපාඩු, අතපසුවීම් වළක්වාගනිමින් සම්පත් සකසුරුවම්ව කාර්යක්ෂම සහ ඵලදායි ලෙස භාවිත කරමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට අවශ්‍ය පදනම සකසා ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව ප්‍රජාපාදක සංවිධානයක් වෙත සෘජු කොන්ත්‍රාත් පැවරීමකදී අදාළ සමිතියේ යෝග්‍යතාවය ඇගයීමට භාවිතා කළ හැකි නිර්නායක පිළිබඳව සැලකිලිමත් විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) රු.252,500 ක් වටිනා මුළුතැන්ගෙයි ශීතාගාරය අළුත්වැඩියා කිරිමේ කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගෙන තිබූ කොන්ත්‍රාත්කරු සමඟ අදාල කාර්යය වෙනුවෙන් ගිවිසුම්ගත නොවී අළුත්වැඩියා කිරීම සිදුකර තිබුණු අතර මෙම අළුත්වැඩියාව සඳහා රු.75,000 ක අතිරේක වියදම් ඇස්තමේන්තුවක් අදාළ කොන්ත්‍රාත්කරු විසින් ලබා දී තිබුණි. එය තාක්ෂණික ඇගයිම් කමිටුව නිර්දේශ කර ඇතත් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. තවද, මෙම අළුත්වැඩියාව නිසි අධික්ෂණයකින් තොරව සිදුකිරීම නිසා නව ප්‍රසම්පාදනයක් සිදුකර නව යන්ත්‍රයක් සවි කිරිමට සිදුවීම හේතුවෙන් ආයතනය රු.1,012,500 ක අතිරේක වියදමක් දරා තිබුණු අතර ශීතාගාරය ක්‍රියාවිරහිත වීම හේතුවෙන් රු.26,920 ක ආහාර තොග නරක් වීමට ලක් වී තිබුණි. | අඩුපාඩු, අතපසුවීම් වළක්වාගනිමින් සම්පත් සකසුරුවම්ව කාර්යක්ෂම සහ ඵලදායි ලෙස භාවිත කරමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට අවශ්‍ය පදනම සකසා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකල යුතුය. |
| (ඇ) ප්‍රධාන ශ්‍රවනාගාරයේ දොරවල් සවිකිරීමට අදාළ ප්‍රසම්පාදනයේදී ඒ සඳහා ඉදිරිපත්ව තිබූ ලංසු ඇගයීමේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය ලබා නොතිබීම යන කොන්දේසිය මත සැපයුම්කරුවන් 03 දෙනෙකුගේ ලංසු ප්‍රතික්ෂේප කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුව විසින් කටයුතු කර තිබුණි. ලංසු කැඳවීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදි සැලකිය යුතුව තිබූ මුලික සුදුසුකම්, ලංසු ඇගයීමේදි භාවිත කිරීම හේතුවෙන් තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීමට බාධා ඇතිකර තිබුණි. | අඩුපාඩු, අතපසුවීම් වළක්වාගනිමින් සම්පත් සකසුරුවම්ව කාර්යක්ෂම සහ ඵලදායි ලෙස භාවිත කරමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට අවශ්‍ය පදනම සකසා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 අගෝස්තු 02 දින ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරෙහි රාජකාරි බාරගෙන තිබුණු නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා සේවයෙන් 2021 නොවැම්බර් 05 දින විශ්‍රාම ගොස් තිබුණු අතර 2021 අගෝස්තු 02 දින සිට 2021 නොවැම්බර් 05 දින දක්වා කාල සීමාව තුලදී ශ්‍රී ලංකා පදනම සහ ශ්‍රී ලංකා නාවික හමුදාව යන ආයතන දෙකෙන්ම වැටුප් සහ දීමනා ලෙස පිළිවෙලින් රු.495,759 සහ රු.319,669 ලබාගෙන තිබුණි. | අධ්‍යක්ෂ (පාලන) තනතුරට බඳවාගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ විගණන විමසුම්වල කරුණු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකළ විගණන පරීක්ෂාවේ නිර්දේශ අනුව මූලික විමර්ශනයක් පවත්වන ලදී. එහි නිර්දේශ මැයි 16 වැනි දා පැවැත්වෙන කළමනාකරණ මණ්ඩල රැස්වීමට යොමු කර ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කෙරේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |